

# ඉන්දියාව සමග නැගිටිමු

ජී. ආර්. ජයවර්ධන මහතාගේ රජය ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවෘත කරන විට ඉන්දියාවේ තිබුණේ සංවෘත භාග සමාජවාදී ආර්ථික ක්‍රමයකි.

කලබල වුණු ඉන්දියාවට ඇමෙරිකන් හිතවාදී ජී. ආර්. රජය පාලනය කරන්නට හොඳ අවස්ථාවක් දුන්නේ ජී. ආර්. මය. ඒ 1983 සිදුවූ දෙමළ ජන සංහාරයට ඉඩ සැලසීමෙනි. ඉන්පසු දෙමළ කැරලිකරුවන්ගේ සංවිධාන කිහිපයක්ම පුහුණු කරන්නට හා ශ්‍රී ලංකා හමුදා සමග සටන් කරන්නටත් රටේ ආර්ථිකය අඩපණ කරන ප්‍රහාර එල්ල කිරීමටත් මේ කණ්ඩායම් හරහා ඉන්දියාවට හැකි විය. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ වඩමාරච්චි සටන නතර කරමින් සිදුවූ පරිප්පු ආක්‍රමණයයි.

ඉන්දියානු හමුදා ශ්‍රී ලංකාවට පැමිණි අතර ශ්‍රී ලංකාව ජීවත්වීමට නුසුදුසු දරුණු රටක් බවට පත්වුණි. ශ්‍රී ලංකාවේ උතුර හා දකුණ එකම ලේ විලක් විය. මේ තත්වයට ජී. ආර්, ප්‍රේමදාස, සිරිමාවෝ, විජේවීර, ප්‍රභාකරන් පමණක් නොව ඉන්දියාව ද වගකිව යුතු විය. ඉන්දියාවට පළමු ප්‍රහාරය ලැබුණේ තමන්ම කිරි පෙවූ නයි පැටියාගෙනි. තම ජාතියේ අභිමානය රැකගෙන ප්‍රභාකරන් රජීව් ගාන්ධි ඝාතනය කළේය.

ඉන්දියාවට චන්ද්‍රිකා සමග ප්‍රශ්නයක් නොතිබුණු නිසා දෙමළ කැරලිකරුවන් සමග යුද්ධය අතර වුවද, රටේ ආර්ථිකය දියුණු වූයේ නැති වුවද චන්ද්‍රිකා බණ්ඩාරනායක දෙවරක්ම රට පාලනය කිරීමට තේරී පත් වූවාය. නමුත් ඉන්දියාව තම අගමැති මරා දැමීමට අණ කළ ප්‍රභාකරන් අමතක කළේ නැත.

චන්ද්‍රිකාගේ දෙවන පාලන සමයේ දී රනිල් වික්‍රමසිංහ සහ එජාපය පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයගෙන රජයක් පිහිටෙව්වේය. බටහිර රටවල උදව්වෙන් ඔහු සාම ගිවිසුමක් අත්සන් කර ගිවිසුම විමසීමට ලංකාවේ තවමත් කුප්‍රකට මොනිටරින් මිෂන් එකක්ද ස්ථාපිත කළේය. ඔහුගේ වැඩපිළිවෙළ, බඹෑ දෙකඩ වී කරුණාගේ නායකත්වයෙන් තවත් කොටසක් බිහි වීමට හේතුවක් විය. එසේම බඹෑ ප්‍රදේශවලට රූපවාහිනී හා නොයෙකුත් සුඛෝපභෝගී උපකරණ යැවුනි. ඉන්දියාව සිටියේ විමසිල්ලෙනි.

ඇමෙරිකාවේ හා යුරෝපයේ සහය රනිල් වික්‍රමසිංහ රජය ට හිමි විය. සිංහලයන් බහුතරයක් අසතුටු වුවද දෙමළ බහුතරයක් සිටියේ සාම විරාමයක් ලැබීමේ සතුටිනි.

කවුරුත් වැඩිපුර නොදන්නා කාරණයක් නම් තරන්ජිත් සිං සඳු නමැති මහතකු වසර 2000 දී ශ්‍රී ලංකාවේ ඉන්දීය තානාපති කාර්යාලයට දේශපාලන නිලධාරියා වශයෙන් පත්වීමක් රැගෙන පැමිණි බවයි.

එසේම ජනතා විමුක්ති පෙරමුණ නමැති වාමාංශික පක්ෂයේ නායකයා ශ්‍රී ලංකාවේ පැවති 88*90 භීෂණ සමයේ ඉන්දියාවේ උදව්වෙන් බටහිරට පැන ගොස් ජීවිතය බේරාගත් අයෙකි.

ඉන්දියාවේ රහස් ඔත්තු සේවයේ නම රෝ හෙවත් පරීක්ෂණ හා විශ්ලේෂණ කිරීමේ කාර්යාංශයයි.

ශ්‍රී ලංකාවට සුනාමිය පැමිණියේ වසර 2004 දීය. දකුණට ලැබුණා සේ උතුරේ විනාශ වූ පෙදෙස්වලටද ආධාර අවශ්‍යය. ආධාර දීමට අන්තර් සුනාමි සහන මණ්ඩලයක් LTTE සමග හැදීමට රනිල්ගේ රජය කැමැත්ත පළ කළ අතර චන්ද්‍රිකා ජනාධිපතිනියගේ විරුද්ධත්වයක් තිබුණේ නැත. මෙහිදී බටහිර රටවල ආධාර කෙලින්ම උතුරේ LTTE සංවිධානයට ලැබේ. ප්‍රභාකරන්, තමිල් සෙල්වම්, බාලසිංහම් ආදීන් ලෝකයේ දෙමළ ඩයස්පෝරාව සිටි රටවල්වල වීරයන් විය.

ඉන්දියාවට අනුව බටහිර සුනාමි ආධාර කෙලින්ම ලැබෙන්නේ තමන් කිරි පොවා ඇති දැඩි කළ එහෙත් පසුව දෂ්ට කළ නයි හාමිටය.



රටේ මේ සහන මණ්ඩලයට විරෝධතා වැඩි විය. ඉදිරියෙන්ම සිටියේ ජනතා විමුක්ති පෙරමුණයි. එසේම ජාතික හෙළ උරුමයද විය. චන්ද්‍රිකා, රනිල් රජයේ ඇමතිවරුන් තිදෙනෙක් අස් කරමින් පාලනය තමන් අතට ගත්තාය. රනිල් ගෙදර ගියේය.

බටහිරට හිතැති කදිරගාමර් මරා දැමුණු අතර මහින්ද රාජපක්ෂ අගමැති විය.

තරන්ජිත් සින් සඳු දේශපාලන නිලධාරී මහතා 2004 දී ඉන්දියන් තානාපති කාර්යාලයෙන් වෙනත් පත්වීමක් ලබා නික්ම ගියේය.

මහින්ද රාජපක්ෂ ඉදිරිපත් වූ 2005 චන්දයේදී ජවිපෙ හා හෙළ උරුමයේ සහයෙන් ඔහුට 50.29% කුත් රනිල් වික්‍රමසිංහට 48.43% කුත් ලැබුණි. ප්‍රභාකරන් හිටියේද මහින්දගේ පැත්තේය. ඔහු දෙමළ ඡන්ද වර්ජනය කිරීමට නියෝග කර ඡන්දය දැමීමට ගිය දෙමළ ඡන්ද දායකයකුගේ අතක්ද කැපුවේය. දෙමළ ඡන්ද තිබුණා නම් මහින්ද 2005 දී බලයට පත්වන්නේ නැත.

කවුරුන් මොනවා කීවත් යුද්ධය සමයේදී මතුපිටින් කිසිදු සහයක් දෙන බවක් නොපෙන්වුවත් ඉන්දියාව බඹෑ සමග ශ්‍රී ලංකා හමුදාවල යුද්ධයට හා මහින්ද රජයට ආධාර කළේය. ඒ ආධාර චැනල් කිරීම සඳහා විශේෂ පුද්ගලයෙක් බැසිල් නමින් සිටියේය.බැසිල් තමන්ට පැවරුණු කාර්යය මැනවින් ඉටු කළේය. කරුණා අම්මාන් සිටියේ ඉන්දියාව පැත්තේය. මහින්ද රජයට කඳුකරයේ තොන්ඩමන් (ඉන්දියාව) ගේ සහය ලැබුණි. නයි හාමිගේ බෙල්ල කපන තුරු ඉන්දියාව මහින්ද රජයට සහය දුන්නේය. ඉන්පසු ඇතිවුණු යුධ අපරාධයක් සේ හැඳින්වෙන සුදු කොඩි සිද්ධියේ ඉන්දියන් ජාතිකයෙකු වන විජේ නම්බියාර් ද ගෑවී සිටි. මේ සිද්ධියේ දී මියගිය කොටි පොලිස්පති නඩේසන් කතා කර තිබුණේද බැසිල් ටය. (මේ සිද්ධියේ බැසිල්ගේ වරදක් නැත. ඉන්දියාව එය දනී.)

දෙවන ජනාධිපතිවරණයෙන් 2010 දී 57% පමණ ඡන්ද සංඛ්‍යාවක් දිනා රාජපක්ෂ මහතා රටේ දැඩි සංවර්ධනයක් දියත් කළේ යුද්ධයෙන් පසුවය. රටට යුද අවිවලින් ආධාර දුන් චීනය ආර්ථික තලයේද බලවතෙකි. මහින්ද රජය ණය ගත්තේ ඔවුන්ගෙනි. ඉන්දියාව ද ආධාර දුන් නමුත් ඔවුනට චීනයට සම වීමට නොහැකි වුණි. හම්බන්තොට නැව් නො ආ වරාය හා ගුවන් යානා නොඑන ගුවන් තොටුපළ චීන ආධාරවලින් හැදුනි. කොළඹ මුහුද ගොඩ කර නව වරාය නගරයක් හැදෙයි. විශාල හෝටල් ඉඩම් චීන කොම්පැනිවලට සින්නක්කර ලැබෙයි. කාලයක් මුළුල්ලේ රජයන් කිහිපයක සිහිනයක්ව තිබූ අධිවේගී මාර්ගය විවෘත වුණි. අසූ ගණන්වල හදන්නට සැලසුම් කර තිබූ ගල් අඟුරු බලාගාරය නොරොච්චෝ ලේ චීන ආධාරවලින් නිම වුනි.

ඉන්දියාව මෙන්ම බටහිර ද කලබල විය. මහින්ද රජයට බටහිර යුධ අපරාධ තර්ජන එල්ල වීමද වැඩි විය. රටේ ජාතිවාදී ප්‍රශ්න ඇති වෙමින් ජාතිවාදී සංවිධාන පැන නැගුණි. මහින්ද රජයේ ද ද 2001*2004 රනිල් රජයේ මෙන්ම දූෂිත මැති ඇමතිවරුන් හා නිලධාරීන් පොකුරු වශයෙන් බිහි වුනි. රාජපක්ෂ රජය රටේ නිතිය තැකුවේ නැති අතර සංචාරකයනට පවා තර්ජන එල්ල වුනි. කොටින්ම රජය ඉතා අපකීර්තිමත් තත්ත්වයකට පත්ව තිබුණු අතර මාධ්‍ය නිදහසට ද තර්ජන එල්ල වී තිබුණි.

38 වන පිටට